1983 ජූලි කලබල සමය තුළදී ජාතික බෙදා හැරීමේ ක්‍රමයෙහි අත්‍යාවශ්‍ය කොටසක් ලෙස සමුපකාර සමිතිවල වැදගත්කම විද්‍යාමාන විය. මූලික පාරිභෝගික ද්‍රව්‍ය සහ අනෙකුත් අත්‍යාවශ්‍ය ද්‍රව්‍යවල හිඟයන් ඉවත් කරමින් ද ඒවායේ සමාන බෙදාහැරීම පවත්වා ගනිමින්ද සමුපකාර සමිති මාහැඟි කාර්ය භාරයක් ඉටු කරන ලදී. මෙම කාලය තුළදී තම සේවාවන් කඩිනමින් ව්‍යාප්ත කිරීමෙන් සහ පුළුල් කිරීමෙන් සමුපකාර අංශය කළ සේවාව ලිහිල් ආර්ථිකයක් තුළදී වුව ද සටහන් කිරීම වටනේය.

මේ කරුණ අනුව, සමුපකාර අංශයේ වාණිජමය වශයෙන් ඵලදායි තත්ත්වයට පත්කිරීම සඳහා ප්‍රමාණවත් මුදල් පහසුකම් පුහුණු කිරීම් සහ අනෙකුත් දිරිගැන්වීම් ලබා දීමේ අවශ්‍යතාවය පිළිගත යුතුව ඇත.

## සංචාරක ව්‍යාපාරය

මූලික වශයෙන් සිය පාලනයෙන් බාහිර වූ හේතූන් නිසා, 1983 වසරේ දී සංචාරක ව්‍යාපාරයේ පසුබෑමක් දක්නට ලැබුණි. සංචාරකයන්ගේ පැමිණීම්, සංචාරක ව්‍යාපාරයේ ඉපැයීම්, හෝටල් උපයෝගීකරණය හෝ සේවා නියුක්තිය වැනි දර්ශකයන් ගැන සළකා බැලීමේදී 1983 දී, මෙම අංශයේ ක්‍රියාකාරිත්වයෙහි අයහපත් තත්ත්වයක් දක්නට ලැබුණි. ජූලි මාසයේ දී දිවයින තුළ ඇතිවූ කැලඹිලි මෙම අංශයේ ක්‍රියාකාරිත්වයෙහි වූ පහත් මට්ටම කෙරෙහි ඉතා තියුණු ලෙස බලපෑ සාධකය විය. ඊට අමතරව, බොහෝ රටවල් ආර්ථික අවපාත තත්ත්වයක සිට යහපත් තත්ත්වයක් කරා පරිවර්තනය වෙමින් පැවතුන අතර අපගේ ප්‍රධාන සංචාරක වෙළඳපොල වූ බටහිර යුරෝපයේ ආර්ථික තත්ත්වය ද මන්දගාමීව පැවතීම නිසා ශ්‍රී ලංකාවට ලැබිය යුතු නියම ප්‍රතිලාභයන්ගේ ගලා ඒමක් සිදු නොවීය.

1983 දී ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය විදේශ විනිමය ඉපයීමේ වැදගත්කම අතින් පහතට වැටෙමින් හය වන ස්ථානයට පත් වූ අතර එය පසුගිය වසරේහි දී සිව්වන ස්ථානය හිමි කරගෙන තිබුණි. 1983 වසර තුළදී මෙරටට පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 3,37,342 ක් වූ අතර මෙය පසුගිය වසරට වඩා සියයට 17 ක අඩුවීමක් පෙන්වීය. පසුගිය වසර කිහිපය මුළුල්ලේ සංචාරකයන් පැමිණීමේ වර්ධන වේගය අඩු වෙමින් පැවතිය ද, 1971 න් පසු එය සෘණ අගයක් ගත් ප්‍රථම අවස්ථාව මෙය විය. පසුගිය වසරේ සම කාලච්ඡේදය හා සසඳන විට 1983 ප්‍රථම භාගයේ දී පැමිණි සංචාරකයින්ගේ ගණන සියයට 10 කින් වැඩි වූ නමුත්, පසු භාගයේදී සියයට 45 කින් අඩු වීම, සංචාරක පැමිණීම් කෙරෙහි ජූලි කලබලවල බලපෑම පැහැදිලිව ප්‍රකට කරන්නක් විය. කෙසේ වෙතත් සඳහන් කළ යුතු අනෙක් වැදගත් කරුණ නම්, සිය රටවැසියන්ට දෙනු ලැබූ තීරු බද්දෙන් නිදහස් දීමනාව, ඉන්දියානු රජය විසින් සීමා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, ඉන්දියාවෙන් මෙරටට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව අඩු වීම නිසා, 1982 ජූනි මාසයට වඩා 1983 ජූනි මාසයේදී සංචාරක පැමිණීම්හි පහත වැටීමක් සිදු වූ බවය. මෙම වසර තුළදී බටහිර යුරෝපය සහ ඔස්ට්‍රේලියාව සංචාරක පැමිණීම් පිළිබඳව ඉහළම සෘණ වර්ධන අනුපාතයන් වාර්තා කළ අතර, එම ප්‍රමාණයන් පිළිවෙලින් සියයට 24 ක් සහ සියයට 22 ක් විය. ඉන්දියානු සංචාරකයන්ගේ පැමිණීම් සියයට 6 කින් අඩුවීම ආසියානු කලාපීය සංචාරක පැමිණීම් සියයට 8 කින් පහත බැසීමට ප්‍රධාන හේතුව විය. උතුරු ඇමරිකාවෙන් පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව සියයට 5 කින් පහත වැටුණි. කෙසේ වෙතත්, විමසුමට ලක් වූ වසර තුළදී නැගෙනහිර යුරෝපයෙන් පැමිණි සංචාරකයින්ගේ ප්‍රමාණය සියයට 7 කින් වර්ධනය විය. සංක්‍රාමික මගින් හැර පැය 24 කට අඩු කලකට රට තුළ රැඳෙන සංචාරකයන්ගේ සංඛ්‍යාව පසුගිය වසරේ සංඛ්‍යාව වූ 6,632 හා සසඳන විට සියයට 33 ක වැඩි වීමක් වාර්තා කරමින් 1983 දී 8,836 ක් විය.

## 1 . 40 සංඛ්‍යා සටහන

### සංචාරක ව්‍යාපාරය පිළිබඳ සංඛ්‍යා ලේඛන 1982—1983

| ශීර්ෂය | 1982 | 1981 ට වඩා ප්‍රතිශත වෙනස | 1983 | 1982 ට වඩා ප්‍රතිශත වෙනස |
|---|---|---|---|---|
| 1. සංචාරක පැමිණීම් .. | 407,230 | 9·8 | 337,342 | – 17·2 |
| 2. පැය 24 කට අඩු කලකට රට තුළ රැඳෙන විදේශික මගීන්ගේ පැමිණීම් .. | 6,632 | – 14·3 | 8,836 | 33·2 |
| 3. සංචාරක දින (රාත්‍රී) ගණන (දහස්) .. | 4,048 | 3·6 | 3,373 | – 16·7 |
| 4. සංචාරකයින්ගෙන් දළ ලැබීම් | | | | |
| 4·1 රුපියල් දශ ලක්ෂ .. | 3,050·4 | 19·8 | 2,560·0 | – 16·1 |
| 4·2 එක්සත් ජනපද ඩොලර් දශ ලක්ෂ .. | 146·6 | 10·7 | 116·0 | – 20·9 |
| 4·3 වි·ගැ·හි· ඒකක දශ ලක්ෂ .. | 132·8 | 18·2 | 101·7 | – 23·4 |
| 5. පැමිණීමේ අරමුණ අනුව සංචාරකයින්ගේ ගණන | | | | |
| 5·1 විනෝදය .. | 361,190 | 8·9 | 306,824 | – 15·0 |
| 5·2 ව්‍යාපාරික කටයුතු .. | 27,484 | 11·5 | 17,022 | – 38·1 |
| 6. කලාප අනුව පැමිණි ගණන | | | | |
| 6·1 බටහිර යුරෝපය .. | 232,290 | – 5·5 | 176,668 | – 23·9 |
| 6·2 ආසියාව .. | 135,088 | 52·2 | 124,564 | – 7·8 |
| 6·3 උතුරු ඇමෙරිකාව .. | 15,528 | 11·3 | 14,740 | – 5·1 |
| 7. මුළු සේවා නියුක්තිය .. | 64,262 | 16·3 | 53,608 | – 16·6 |
| 7·1 ඍජු .. | 26,776 | 16·3 | 22,374 | – 16·4 |
| 7·2 වක්‍ර .. | 37,486 | 16·3 | 31,234 | – 16·7 |

මූලය: ලංකා සංචාරක මණ්ඩලය.

වෙළෙඳපොල කොටස් ගැන විමසීමේ දී බටහිර යුරෝපයට තවදුරටත් විශාලම කොටස හිමි වූ නමුත්, 1982 දී සියයට 57 ක් වූ එම කොටස, 1983 දී සියයට 52 දක්වා අඩු වී ඇත. මූලික වශයෙන්, 1982 දී සියයට 23 ක් වූ ඉන්දියානු සංචාරකයන්ගේ ප්‍රතිශත කොටස මේ වසරේදී සියයට 27 දක්වා වැඩිවීම නිසා ආසියානු කලාපයට හිමි ප්‍රතිශත කොටස 1982 දී වූ සියයට 33 සිට 1983 දී සියයට 40 දක්වා වැඩි වී ඇත. 1983 දී ඔස්ට්‍රලේෂියාව හැරුණුවිට අනෙකුත් සියළුම කලාපයන් සිය ප්‍රතිශත කොටස් වැඩි කරගෙන ඇත. කෙසේ වෙතත්, මෙම වසර තුළදී ඇතිවූ අසාමාන්‍ය තත්ත්වයන් නිසා මෙම කොටස් මගින් දිගුකාලීන උපනතියක් පෙන්නුම් නොකරයි.

සංචාරක පැමිණීම්වල පරිමාව දැක්වීමට දළ පැමිණීම් සංඛ්‍යාවට වඩා යෝග්‍ය දර්ශකයක් ලෙස සැළකෙන සංචාරකයන් රට තුළ ගත කළ මුළු දින ගණන (මෙය මුළු සංචාරකයන්ගේ සංඛ්‍යාව, ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණනින් වැඩි කිරීමෙන් ලැබෙන සංඛ්‍යාවයි). 1983 දී 33,73,420 ක් වූ අතර, එය 1982 සංඛ්‍යාව වූ 40,48,409 හා සසඳන විට සියයට 17 ක අඩු වීමක් වාර්තා කළේය. සංචාරකයකු ශ්‍රී ලංකාවේ ගත කරන සාමාන්‍ය දින ගණන පෙර වසරේ ප්‍රමාණය මෙන්ම 1983 දී ද දින (රාත්‍රී) 10 ක් විය.

1983 දී ද මෙරටට පැමිණීමේ මූලික පරමාර්ථය තවදුරටත් විනෝදශ්වාදය විය. 1982 දී මුළු පැමිණීම් වලින් සියයට 89 ක් වූ එම පරමාර්ථයෙන් පැමිණි ප්‍රමාණය හා සසඳන විට 1983 ප්‍රමාණය සියයට 91 ක් විය. පසුගිය වසරේ මෙන්ම 1983 දී ද ශ්‍රී ලංකාවට පැමිණීමේ ප්‍රධාන මාර්ගය වූයේ ගුවන් මගින් පැමිණීමය.

පසුගිය වසරේ දී මෙන්ම මෙම වසරේදී ද ලේඛණගත හා කුලී ගුවන් යානා මගින් පැමිණි ප්‍රමාණය ආසන්න වශයෙන් මුළු සංචාරකයින්ගේ සංඛ්‍යාවෙන් සියයට 87 ක් විය. ගුවන් මගින් පැමිණි මුළු සංචාරකයන්ගෙන් කුලී ගුවන් යානා මගින් පැමිණි ප්‍රමාණය, 1982 දී සියයට 16 ක් වූ අතර, එම ප්‍රමාණය 1983 දී සියයට 14 දක්වා පහත වැටුණි. ජූලි මාසයේ ඇති වූ කැලඹිලි සහගත තත්ත්වය නිසා කාණ්ඩ වශයෙන් පැමිණෙන සංචාරක ගමන් විශාල ප්‍රමාණයක් අවලංගු කිරීම මීට හේතු විය.

1983 දී සංචාරක කර්මාන්තයේ දළ ඉපැයීම් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 2,560 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, මෙය පසුගිය වසර හා සසඳන විට සියයට 16 ක අඩු වීමක් පෙන්නුම් කරයි. පසුගිය වසර හා සසඳන විට මෙම ඉපැයීම් විගැහි වටිනාකම අනුව සියයට 23 කින් පහත වැටී තිබුණි.

සංචාරක ව්‍යාපාරය ශ්‍රම සුක්ෂම කර්මාන්තයක් වන අතර එමගින් සෘජුව මෙන්ම වක්‍රව ද රැකියාවන් ජනනය කෙරේ. කෙසේ වෙතත්, මෙම වසරේ අග භාගයේ සංචාරකයන්ගේ පැමිණීම් අඩුවීම, මෙම අංශයේ රැකියාවන් කෙරෙහි බලපෑවේය. 1982 දී 26,776 ක් වූ මෙම අංශයේ සෘජු රැකියාවන් සංඛ්‍යාව 1983 දී 22,374 දක්වා පහත වැටිණ. 1983 දී සංචාරක කර්මාන්තය නිසා සෘජු නොවන රැකියාවන්හි යෙදුනු සංඛ්‍යාව 31,234 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය පසුගිය වසරෙහි දී 37,486 ක් විය. විශේෂයෙන්ම මෙම වසරේ දෙවන භාගයේදී සංචාරක කටයුතුවල වූ පහත් මට්ටමෙහි ප්‍රතිඵලයක් වශයෙන් සංචාරක කර්මාන්තයේ සෘජු ලෙස සේවයෙහි නියැලුණු අනියම් කම්කරුවන්ගේ අතිරික්තයක් මෙම කාලසීමාවේදී පැවතිණ. කෙසේ වෙතත්, මෙම තත්ත්වය තදින්ම බලපෑවේ සංචාරක අංශයේ වක්‍රව රැකියාවන් කළ අය කෙරෙහිය.

1982 දී ඒකක 123 ක් වූ ශ්‍රෙණිගත නවාතැන් අංශයේ ධාරිතාවය, 1983 දී ඒකක 136 දක්වා වැඩි වූ අතර මුළු කාමර ගණන 7,539 සිට 8,643 දක්වා ඉහළ නැගුණි. කෙසේ වෙතත්, පසුගිය වසර හා සසඳන විට වාර්ෂික කාමර උපයෝගිතා අනුපාතය 1982 දී වූ 47.8 සිට 1983 දී 35.9 දක්වා තියුණු ලෙස පහත වැටුණි. 1983 ප්‍රථම භාගයේදී වාර්ෂික හෝටල් උපයෝගිතා අනුපාතය සියයට 47.0 ක් විය. මෙය පසුගිය වසරේ සම කාලච්ඡේදයේ වාර්තා වූ සියයට 50.8 සමග සසඳන විට පහත් මට්ටමක පැවතිණි. මෙරටට පැමිණි සංචාරකයන්ගේ සංඛ්‍යාව වැඩි වී ඇති නමුත්, ශ්‍රෙණිගත නවාතැන් අංශයේ උපයෝගිතා අනුපාතය, 1980 සිට ක්‍රමයෙන් පහත වැටෙමින් ඇත. මෙයින් පෙනී යන්නේ සංචාරකයන් නවාතැන් පහසුකම් සඳහා ශ්‍රෙණිගත අංශයෙන් බැහැර ස්ථාන කරා ඇදී යාම වැඩි වී ඇති බවය.

ශ්‍රෙණිගත නවාතැන් අංශයේ උපයෝගිතාවය පිළිබඳ කලාපීය දත්තයන්ට අනුව කොළඹ නගරය සහ මහ කොළඹ ප්‍රදේශය පිළිවෙලින් සියයට 52 ක හා සියයට 40 ක ඉහළම වාර්ෂික උපයෝගිතා අනුපාතයන් පෙන්නුම් කර ඇත. වැඩිම ධාරිතාවයක් ඇති දකුණු වෙරළබඩ ප්‍රදේශයේ වාර්ෂික උපයෝගිතා අනුපාතය සියයට 33 ක් විය. නැගෙනහිර වෙරළබඩ, උඩරට සහ පෞරාණික නගර ප්‍රදේශවල වාර්ෂික උපයෝගිතා අනුපාතය සියයට 30 කට ආසන්න විය. උතුරු දිග ප්‍රදේශය අඩුම වාර්ෂික උපයෝගිතා අනුපාතයක් වාර්තා කළ අතර, එම ප්‍රමාණය සියයට 11 ක් විය. වාර්ෂික උපයෝගිතා අනුපාතයන් සැසඳීමේදී තියුණු අඩු වීමක් වාර්තා කෙරෙන්නේ උතුරුදිග සහ නැගෙනහිර වෙරළබඩ කලාප වලිනි. සංචාරක පැමිණීම් වළකාලන අන්දමේ ආරක්ෂක ගැටළු මතු වීම නිසා 1983 දී මෙම ප්‍රදේශ දෙකෙහි වාර්ෂික උපයෝගිතා අනුපාතයන් පිළිවෙලින් සියයට 45 කින් සහ සියයට 36 කින් පහත වැටුණි. දකුණු වෙරළබඩ සහ පෞරාණික නගර ප්‍රදේශවලත් වාර්ෂික උපයෝගිතා අනුපාතයන් 1983 දී පිළිවෙලින් සියයට 30 කින් සහ සියයට 20 කින් පහත වැටීමෙන්, 1983 වර්ෂය අතිශයින් අවාසනාවන්ත වසරක් බවට පත් විය. විශේෂයෙන්ම දකුණු වෙරළබඩ ප්‍රදේශයේ, ශ්‍රෙණිගත නවාතැන් අංශයේ කාමර සංඛ්‍යාව සැලසුමකින් තොරව වැඩි කිරීම නිසා මෙම ගැටළුව තවත්

උග්‍ර වී ඇත. පසුගිය වසර කිහිපය මුළුල්ලේ අඩු වීමේ උපනතියක් පවතින හෝටල් උපයෝගිකරණය ගැන සළකා බැලීමේදී ධාරිතාවය පුළුල් කිරීමේ සැලසුම් කෙරෙහි නිසි තක්සේරුවක් කර නොමැති බව පෙනේ. 1983 දී උදාරට, මහ කොළඹ සහ කොළඹ නගරයේ වාර්ෂික උපයෝගිතා අනුපාතයන් පිළිවෙලින් සියයට 21 කින්, සියයට 19 කින් සහ සියයට 17 කින් පහත වැටුණි. ඇඳන්/කාමර අනුපාතය 1982 දී වූ 1.7 සිට 1983 දී 1.65 දක්වා පහත බැස ඇත. මෙයින් පෙන්නුම් කෙරෙන්නේ දෙනු ලැබූ සෑම කාමර 100 කම අමුත්තන් 165 දෙනකු නවාතැන් ගත් බවය. ශ්‍රේණිගත නවාතැන් අංශයේ පැවති අධි ධාරිතාවය නිසා නව හෝටල් යෝජනා ක්‍රම සඳහා මූල්‍යමය දිරි දීමනා (බදු විරාම සහ අවශ්‍ය උපකරණ ආනයනයේදී තිබූ තීරු බදු නිදහස) ලබා දීම 1983 අප්‍රේල් මාසයේ සිට රජය විසින් නතර කරනු ලැබිණි. මෙයට අනුරූපීව, මේ අංශයට ලබා දුන් මහ බැංකුවේ ප්‍රතිමූල්‍ය පහසුකම් ද, ආයෝජන සීමා කිරීමේ අරමුණ ඇතිව අඩු කරන ලදී. පසුගිය සමයේ සිදුවුණු කලබල නිසා සංචාරක පැමිණීම් අඩු වීමෙන් ශ්‍රේණිගත නවාතැන් අංශයට ඉතා තියුණු බලපෑමක් ඇති වූ අතර, මූල්‍යමය ශක්‍යතාවය ආරක්ෂා කිරීම් වස්, සමහර නිකේතන හෝටල් කොටස් වශයෙන් වැසීමට ද සේවකයන් ඉවත් කිරීමට ද සිදු විය. හෝටල් ගණනාවක්ම දරුණු මූල්‍යමය දුෂ්කරතාවලට මුහුණ පෑවේය.

ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තයෙහි පුනර්ජීවනයක් ඇති කිරීමේ අදහසින්, පිටරට සිට මෙරටට සංචාරකයන් ඇද ගැනීම සඳහා විදේශයන්හී විශාල ප්‍රචාරක ව්‍යාපාරයක් දියත් කිරීම පිණිස රජය මගින් රුපියල් දශ ලක්ෂ 40 ක මුදලක් වෙන් කොට ඇත. එසේම සංචාරක කටයුතු අඩු වීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම කර්මාන්තය මුහුණ පෑ දුෂ්කරතාවයන් මැඩ පවත්වනු වස් රජය මගින්, සංචාරක අංශය සඳහා වූ ව්‍යාපාර පිරිවැටුම් බද්ද සියයට 15 සිට සියයට 10 දක්වා පහත හෙලන ලදී. පටු වෙළඳපොලක් කෙරෙහි රැඳී සිටීමෙන් මතු වන ගැටළු වලින් මිදීමේ අපේක්ෂාවෙන් සංචාරක ව්‍යාපාරය නංවාලීමේ නව උපාය මාර්ගයක් වශයෙන් සංචාරකයන් පැමිණෙන වෙනත් වෙළඳපොලවල් සොයා ගැනීමේ වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරගෙන යයි. මෙතෙක් කල් ශ්‍රී ලංකාව පසු කරමින් යන වෙළඳපොලේ ඉහළ ආදායම් ලබන කොටස් ඇද ගැනීම සඳහාත්, වැඩි ආදායම් උපදවා ගතහැකි සංචාරකයන්ට විශේෂ උනන්දුවක් ඇති කිරීම සඳහාත් සැලසුම් සකස් කර ඇත.

## ගෙවුම් තුලනය

### ගෙවුම් තුලන විග්‍රහය

1983 දී දක්නට ලැබුණු වෙළෙඳ අනුපාතයේ කැපී පෙනෙන දියුණුව සහ විදේශයන්හි සේවය කරන්නන් විසින් එවනු ලැබූ ප්‍රේෂණයන් තවදුරටත් ඉහළ යාම, විගැහි වටිනාකම් අනුව සලකා බැලීමේදී ජංගම ගිණුමේ හිඟය සැළකිය යුතු ප්‍රමාණයකින් පටු කිරීමට හේතු විය. 1982 පැවති රුපියල් දශ ලක්ෂ 11,919 (විගැහි දශ ලක්ෂ 519) ක් වූ ජංගම ගිණුම් හිඟය සමග සසඳන විට 1983 දී එය රුපියල් දශ ලක්ෂ 11,185 (විගැහි දශ ලක්ෂ 445) ක් ව පැවතුනි. 1982 වසරේ පිරිහුණු ගෙවුම් තුලන තත්ත්වයට හේතු වූ සාධකයන්හි තියුණු වෙනසක් මෙම වසර තුළදී දක්නට ලැබුනි. 1977 සිට අඛණ්ඩ ලෙස පිරිහෙමින් පැවතුන වෙළෙඳ අනුපාතය, ප්‍රධාන වශයෙන්ම, ශ්‍රී ලංකාවේ වැවිලි අපනයන මිළයන්හි හදිසි ඉහළ නැගීම සහ ඛනිජ තෙල් මිළ ගණන් පහත වැටීම නිසා 1983 වසරේදී ශ්‍රී ලංකාවට වාසිදයක ලෙස වෙනස් විය. මන්දගාමී අපනයන වර්ධනයක් හා සීඝ්‍ර ආනයන වර්ධනයක් දක්නට ලැබුණු 1982 වසර හා සැසඳීමේදී 1983 දී විගැහි වටිනාකම් අනුව ආනයන සියයට 1 කින් පහළ වැටෙද්දී අපනයන සියයට 7.6 කින් ඉහළ නැගුනි. දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ජංගම ගිණුමේ හිඟය 1982 සියයට 11.9 සිට 1983 දී සියයට 9.4 ක් දක්වා අඩු විය. නිල සංක්‍රාම ඉවත් කළවිට ජංගම ගිණුමේ හිඟය 1982 දී රුපියල් දශ ලක්ෂ 15,298 (විගැහි දශ ලක්ෂ 666) ක් වූ අතර, මෙම වසරේදී එය රුපියල් දශ ලක්ෂ 15,201 (විගැහි දශ ලක්ෂ 605) ක් විය.මෙය දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස ගත්කල එය වර්ෂ දෙක අතරදී සියයට 15.3 සිට 12.4 දක්වා පහත වැටීමක් පෙන්නුම් කරයි.